# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1815/32 - 2013 ජුනි මස 22 වැනි සෙනසුරාදා - 2013.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මගේ අංකය:ව/ඉ/2/2066.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාගම් කෝරළය 850 පැලවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පැලවත්ත ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක 112 දරන අවසාන ගම් පිඹුරේ කැබලි අංක 2524 ලෙස පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0025 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල:

01. **කැබලි අංක 2524**

*ඉඩමේ නම*: දෙමෝදර ගන්කන්ද නොහොත් දෙමෝදර පිටකට්ටිය; *ඉඩමේ විස්තරය*: විවෘත මුඩුබිම; *හිමිකම් කියන්නා*: රජය; *මුල් හිමිකම් පාන්නා*: හෙට්ටිආරච්චිගේ දොන් වීරරත්න, වෙලේගෙවත්ත, පිටිගල පාර, පැලවත්ත; *ප්‍රමාණය*: හෙක්. 0.0025.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013.07.29 දින පූ.භා. 10.00ට වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ වියයුතුයි.

තව ද 2013 ජූලි 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එම්.එල්. දශිත නිරෝෂණ,<br>ප්‍රාදේශීය ලේකම්,<br>වලල්ලාවිට.

2013 ජුනි මස 17 වැනි දින,<br>වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ය.<br>වලල්ලාවිට.

07 - 187

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මගේ අංකය: මහ/3/274/අත් I.

පහත සඳහන් ඉඩම් පොදු කටයුතු සඳහා අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන (සංශෝධිත) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාව තුළ, මහරගම ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක පී.පී.කො. 9330 දරන මූලික පිඹුරේ පෙන්නුම් කරන ලද පහත සඳහන් ඉඩම් කැබැල්ල:


1A-G 017838 - 350 (2013/06)

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

01. **කැබලි අංක 01**

*ඉඩමේ නම*: දියපොරගහලන්ද සහ දෙනිය; *ඉඩමේ විස්තරය*: ප්‍රවේශ මාර්ගය; *හිමිකම් කියන අය*: රජය; *මුල් හිමිකම් කියන අය*: ඒ. ටී. එම්. ප්‍රනාන්දු; *ප්‍රමාණය*: හෙක්. 0.0081.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ, 2013 ජූලි මස 17 දින පෙ. ව. 09.30ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ වියයුතු ය.

තව ද, 2013 ජූලි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2013 ජූනි මස 05 වැනි දින,
මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහරගම.

07 - 188

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

## 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය:ශ්‍රී ජපුර/ඉඅ/6/54.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර*:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාගම් කෝරළය සුළු කොට්ඨාසයේ 521- ඇතුල් කෝට්ටේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඇතුල් කෝට්ටේ (කොට්ටාස අංක 03, ඇතුල් කෝට්ටේ-ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක කො: 9131 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0059 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබල්ල:

01. **කැබලි අංක 01**

*ඉඩමේ නම*: ඊ.ඩබ්ලිව්. පෙරේරා මාවතේ වරිපනම් අංක 982 දරණ ඉඩම; *ඉඩමේ විස්තරය*: ගෙවත්ත. අවු. 25 ක පමණ වන අඹ ගසක් ඇත; *හිමිකම් කියන්නා*: රජය; *මුල් හිමිකම්පාන්නා*: අයිරාංගනී අමරතුංග, අංක 982, කෝට්ටේ පාර, ඇතුල් කෝට්ටේ; *ප්‍රමාණය*: හෙක්. 0.0059.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013.07.31 දින පූ.භා. 10.00ට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2013 ජූලි 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලු හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අමල් ජේ.එස්.එස්.එදිරිසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

2013 ජූනි මස 17 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

07 - 189

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.